සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved


# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## දේශපාලන විද්‍යාවේ මූලිකාංග - I

**12 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

උපදෙස් :-
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා ඊට අයත් අංකය වරහන් තුළ දක්වන්න.

---

- **අංක 01 සිට 20 දක්වා වූ ප්‍රශ්න වලට සපයා ඇති ප්‍රකාශ පහ අතරින් හතරක් පමණක් නිවැරදිය. නිවැරදි ප්‍රකාශ පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.**

(01) දේශපාලන විද්‍යාව සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A විද්‍යාත්මක ක්‍රම ශිල්ප යොදා ගනිමින් සාර්ථකව අධ්‍යනය කළ නොහැකි බවය.
B අග්‍රගන්‍ය සමාජ විද්‍යාවක් බවය.
C ස්ථිර නිගමනවලට එළඹීමට නොහැකි බවය.
D මිනිස් සංහතියේ පරිණාමයේ මූලාරම්භය බවය.
E පර්යේෂණාගාරය, සමස්ථ සමාජය වන බවය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(02) දේශපාලන විද්‍යාව හා සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

A සමාජ විද්‍යාවන් අතුරෙන් පැරණිතම සමාජ විද්‍යාවක් වීම.
B සහෝදර සමාජයීය විද්‍යා විෂයන්ගේ මූලිකයා බවය.
C ග්‍රීක යුගයේ සිට විධිමත් අධ්‍යාපනය කිරීම ආරම්භ කළ බවය.
D මේ දක්වා වෙනස් වෙමින් විෂය පථය පුළුල් වූ බවය.
E රාජ්‍ය හා බලය පිළිබඳ පමණක් හදාරන බවය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(03) දේශපාලන විද්‍යාව ඉගෙනීමේ අරමුණ වන්නේ,

A රටවැසියන්ගේ සමාජ වගකීම් පිළිබඳ හැඟීම් වර්ධනය කිරීමය.
B අන්තර්ජාතික දේශපාලනයේ නව ප්‍රවණතා හඳුනාගැනීමය.
C ආණ්ඩු බලය, බලෙන් අල්ලාගැනීමේ උපක්‍රම දැන ගැනීමය.
D දේශපාලන අවබෝධය පුළුල් කිරීමය.
E ආණ්ඩුවේ ක්‍රියාකාරීත්වය හොඳින් අවබෝධ කරගැනීමය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(04) දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය අදාළ වන්නේ,

A ඡන්ද දායකයන්ගේ චර්යාව.
B රාජ්‍යයන් අතර පවත්නා සම්බන්ධතාවයන්.
C දේශපාලන මතවාද සහ සංකල්ප.
D ව්‍යාපාරික ආයතනවල කළමණාකරණය.
E අන්තර්ජාතික දේශපාලනයේ වෙනස් වීම්.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(05) දේශපාලන විද්‍යාව අධ්‍යයනය කළ යුග වන්නේ,

A රෝම යුගය
B ග්‍රීක යුගය
C වැඩවසම් යුගය
D නූතන යුගය
E මධ්‍යතන යුගය

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(06) දාර්ශනිකයා හා ගළපා ඇති අදහස නිවැරදි වන්නේ,

A ජෝන් ලොක් ස්වාධිපති බලය දරන්නේ මහජනයාය.
B ජීන් ජැක්වින් රූසෝ මිනිසා නිදහස්ව උපන්න ද හැමතැනම යදමින් බැඳ ඇත.
C මැකියාවේලී බලය ලබාගැනීම සඳහා යොදාගන්නා ඕනෑම මාර්ගයක් සාධාරණ වේ.
D ප්ලේටෝ අයිතිවාසිකම් මිනිසාට ස්වභාව ධර්මයෙන්ම හිමි වේ. රාජ්‍ය ඒවා සුරැකිය යුතුයි.
E ඇඩලොෆ් හිට්ලර් රාජ්‍ය පංතියක ආයුධයක් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(07) දේශපාලන විද්‍යාව අධ්‍යන මාර්ග සම්බන්ධයෙන් නිවැරදි වන්නේ,

A ඓතිහාසික අධ්‍යන මාර්ගය දේශපාලනයේ සමාජ පදනම අධ්‍යනය කරයි.
B පද්ධති විශ්ලේෂණ මාර්ග ඕනෑම දේශපාලන ප්‍රපංචයක් ගෙන අධ්‍යනය කරනු ලබයි.
C තුලනාත්මක අධ්‍යන මාර්ග වර්තමාන හා අතීත දේශපාලන ක්‍රම තුලනාත්මකව හදාරයි.
D චර්යාවාදී අධ්‍යන මාර්ගය දේශපාලන අවස්ථාවල මානව චර්යාවේ හැසිරීම් අධ්‍යනය කරයි.
E දාර්ශනික අධ්‍යන මාර්ගය කලින් සකසා ගත් න්‍යාය සහ සිතාගැනීම් මත රඳා පවතී.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(08) පැරණි ග්‍රීක පෞර රාජ්‍ය වලට වලංගු වන්නේ,

A පුරවැසියන් කෙලින්ම රාජ්‍ය පාලන කටයුතුවලට සහභාගී වේ.
B රාජ්‍යයේ කටයුතු නූතන රාජ්‍යයක මෙන් පැහැදිලිව බෙදා වෙන් කොට තිබුණි.
C මහේස්ත්‍රාත්වරු හා නිලධාරීහු පුරවැසි සභාවල වගකීමට බැඳී සිටිහ.
D ගැහැණු, විදේශිකයන් හා වහලුන් යන අයට පුරවැසි කමක් නොතිබුණි.
E පාලකයා, පුරවැසියන් විසින් කෙළින්ම පත් කර ගන්නා ලදී.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(09) රාජ්‍ය පිළිබඳ විකාශනාත්මක න්‍යායට අදාළ වන්නේ,

A රාජ්‍ය බිහි වූයේ සමාජ සම්මුතියක ප්‍රතිඵලයක් ලෙසය.
B රාජ්‍ය හිතාමතා ගොඩනැගූ සංවිධානයක් නොවේ.
C රාජ්‍ය විකාශනයේ ප්‍රාථමික ඒකකය පවුල වේ.
D රාජ්‍ය දීර්ඝ ඓතිහාසික විකාශනයක ප්‍රතිඵලයකි.
E සමාජ බන්ධන රාශියකින් පැවැත්ම තහවුරු කරයි.

(10) රාජ්‍ය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A සැම රාජ්‍යයකටම නිල නාමයක් ඇත.

B අනිකුත් සමාජ සංවිධාන රාජ්‍යයට යටත් ය.

C රාජ්‍යයේ සාමාජිකත්වය ස්වේච්ඡාත්මක වේ.

D සමාජයට පසුව බිහිවිය.

E ස්වාධිපති බලය හිමි එකම සංවිධානය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(11) ආණ්ඩුව සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A එය රාජ්‍යයේ බලය ක්‍රියාවට නංවයි.

B එහි ස්වරූපය රාජ්‍යයෙන් රාජ්‍යට වෙනස් වෙයි.

C එක් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමකින් සමන්විත විය හැක.

D එය වෙනස් කළ නොහැකි දෙයකි.

E එහි කාර්යයන් පොලීසිය හා සිවිල් සේවාව මගින් ක්‍රියාවට නංවයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(12) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක පාලකයින් සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A ජනතා සුභසාධනය සම්බන්ධයෙන් අවධානය යොමු කරයි.

B මැතිවරණ ක්‍රියාදාමයකින් පත් වේ.

C ජනතාවට වගකීමට බැඳී සිටියි.

D ජනතා බලයේ භාරකරුවන් ලෙස සලකයි.

E රාජ්‍ය දේපළ පෞද්ගලිකව භුක්ති විඳිය හැක.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(13) ජාතිය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A දේශපාලන වශයෙන් ස්වාධීන වේ.

B වර්ණභේදවාදය අනුව හඳුනාගත හැක.

C නිශ්චිත දේශ සීමාවන්ගෙන් යුත් භූමියක පදිංචි මිනිසුන්ගේ එකතුවකි.

D එක් වාර්ගික කොටසකින් හෝ කිහිපයකින් සමන්විත වේ.

E රාජ්‍ය නාමය හැඳින්වීම මගින් අනන්‍යතාවය තහවුරු කරයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(14) කොමියුනිස්ට් න්‍යායට අනුව රාජ්‍ය පිළිබඳ අදාළ වන්නේ,

A කොමියුනිස්ට් සමාජ ක්‍රමය අනුව රාජ්‍යය වියැකී යන්නේ ය.

B රාජ්‍යය, බලය හිමි පංතියේ උපකරණයක් වෙයි.

C සමාජවාදී යුගය පංති විරහිත සමාජයක් උදා කරයි.

D ප්‍රාග් කොමියුනිස්ට් යුගය මූලික අවධියයි.

E ආර්ථික සමානාත්මකතාවය දක්නට නොලැබෙයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

The National e-Learning Portal for The General Education

(15) රාජ්‍ය පිළිබඳව පැසිස්ට් න්‍යායට අදාළ වන්නේ,

A රාජ්‍ය තුළ බලය අසහාය වේ.
B නායකත්වය වන්දනීය ස්වරූපයක් ගනියි.
C පුද්ගල අවශ්‍යතාවලට මූලිකත්වය ලබා දෙයි.
D ජාතිවාදය ඉහළින්ම අගය කරයි.
E සංවිධාන අහෝසි කරයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(16) ලිබරල්වාදී න්‍යායට අනුව රාජ්‍ය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A රාජ්‍යය ස්ථාවර දෙයක් වේ.
B රාජ්‍යය සමාජ ප්‍රභූන්ගේ ආයුධයක් වේ.
C රාජ්‍යය මිනිස් හැසිරීමේ ස්භාවික ප්‍රතිඵලයකි.
D පුද්ගල තත්ත්වය උසස් කිරීමෙහිලා දායක වෙයි.
E අයිතිවාසිකම් අගය කරයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(17) නිදහස පිළිබඳ සංකල්පයට අදාළ වන්නේ,

A කොටසකගේ අයිතිවාසිකම් අනෙක් අයගේ කැමැත්ත මත රඳා පවතී නම් එතැන නිදහස නොමැත.
B නිදහස හා අධිකරණය එකිනෙකට බද්ධ වේ.
C කෙනෙකුගේ රුචිකත්වය අනුව හැසිරීමට ඇති අයිතිය නිදහසයි.
D සමාජගත නීතිවලට අනුව නිදහස භුක්ති විඳිය හැක.
E නිදහස ආරක්ෂා කර ගැනීමට රාජ්‍ය අත්‍යවශ්‍ය වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(18) සමානාත්මතා පිළිබඳ සංකල්පයට අදාළ වන්නේ,

A කෙනෙකුට සහතික කර ඇති අයිතිවාසිකම් අනිකුන්ට ද සහතික කළ යුතු බව එයින් කියැවේ.
B නිදහස සුරක්ෂිත කිරීමට සමානාත්මතාවය අත්‍යවශ්‍ය වේ.
C සියලු දෙනාම සමානව සැලකීම සමානාත්මතාවය වේ.
D රාජ්‍ය අයිතිවාසිකම් රැකදීමට බැඳී සිටියි.
E සමානාත්මතාවය තුළින් සෑම දෙනාටම සමාන අවස්ථා, ලාභය ඇති කළ යුතු ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(19) අයිතිවාසිකම් පිළිබඳ සංකල්පයට අදාළ වන්නේ,

A අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට නීති අවශ්‍ය වේ.
B නීතිය මඟින් ඕනෑම ඉල්ලීමක් අයිතිවාසිකම් බවට පත් කළ හැක.
C සමාජය පිළිගත් පුද්ගල ඉල්ලීම් අයිතිවාසිකම් වේ.
D රාජ්‍ය අයිතිවාසිකම් රැකදීමට බැඳී සිටියි.
E පුද්ගලත්වය පරිපූර්ණ කිරීමේ කොන්දේසි අයිතිවාසිකම් වේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

(20) නීතියක අඩංගු මූලික ලක්ෂණ වන්නේ,

A පුද්ගල අභ්‍යන්තර හැසිරීම් පාලනය කළ යුතු ය.
B නිරවුල් සහ පැහැදිලි විය යුතු ය.
C සමාජ පොදු යහපත පදනම් කර ගත යුතු ය.
D කඩකිරීම්වලදී දඬුවමට යටත් කළ යුතු ය.
E වෙනස් වන සමාජයට උචිත ලෙස සංශෝධනය විය යුතු ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......)

- **අංක 21 සිට 38 දක්වා වූ ප්‍රශ්නවල ප්‍රකාශ පහ අතුරෙන් එකක් වැරදිය. වැරදි ප්‍රකාශය තෝරන්න.**

(21) යුතුකම් සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,
(1) අයිතිවාසිකම් සමඟ කිට්ටුවෙන් බැඳී ඇත.
(2) නීතිමය හා සදාචාර වශයෙන් දෙයාකාරය.
(3) යහපත් සමාජ පැවැත්ම සඳහා පුරවැසියන් ඉටු කළ යුතු සමාජ බැඳීම් ය.
(4) අයිතිවාසිකම් නොමැති තැන යුතුකම් ඉටු නොවේ.
(5) සමාජ ප්‍රභූන් පමණක් ඉටුකළ යුතු සමාජ බැඳීම් ය. (......)

(22) අධිකරණයේ ස්වාධීනතාවය සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,
(1) දේශපාලන බැඳීම්වලින් තොරවීම.
(2) සේවයේ හා ගෙවීම්වල සුරක්ෂිතභාවය ඇති කිරීම.
(3) අප්‍රසිද්ධියේ නඩු විභාග කළ යුතු ය.
(4) සුදුසුකම් මත විනිශ්චය කරුවන් පත්කළ යුතු ය.
(5) විනිශ්චය කරුවන් වෙනත් සේවාවන් වල යෙදවීමෙන් වැළකිය යුතු ය. (......)

(23) ඒකාධිපති පාලන ක්‍රමයක ලක්ෂණයක් නොවන්නේ,
(1) නිල කාලය ස්ථිර කර තිබීමය.
(2) බලය මත පදනම් වීමය.
(3) වෙනත් බල අධිකාරියකට වග නොකීමය.
(4) තනි පුද්ගල පාලනයක් සිදු කිරීමය.
(5) බුද්ධිමතුන් ප්‍රතික්ෂේප කිරීමය. (......)

(24) නම්‍ය ආණ්ඩුක්‍රමයට අදාළ නොවන්නේ,
(1) ආඥාදායක පාලනයකට මඟපෙන්වීමය.
(2) අලිඛිත ආණ්ඩුක්‍රමයක් වීමය.
(3) කාලානුරූපව වෙනස් කිරීමට හැකි වීමය.
(4) අවස්ථාවාදී දේශපාලනයට උචිත වීමය.
(5) පාලකයාගේ බලය වර්ධනය කිරීමට අවස්ථාව ලැබීය. (......)

(25) ඒකීය ආණ්ඩු ක්‍රමයකට අදාළ නොවන්නේ,
(1) ආණ්ඩුක්‍රමය ව්‍යවස්ථාව තුළින් බලය විමධ්‍යගත කර තිබීම.
(2) කුඩා රාජ්‍යයන්ගේ සංවර්ධනයට උචිත වීම.
(3) ද්විත්ව පුරවැසිභාවයක් නොමැතිවීම.
(4) ගැටුම් අවම වීම.
(5) විධායකයේ බලය වර්ධනය වීම. (......)

(26) සන්ධීය ආණ්ඩුක්‍රමයකට අදාළ නොවන්නේ,

(1) තල දෙකක ආණ්ඩු පැවතීම.

(2) භින්න වූ සමාජවලට.

(3) ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් පැවතීම.

(4) බලය අධික ලෙස සංකේන්ද්‍රණය වී තිබීම.

(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනිවාර්යයෙන්ම ලිඛිත වීම. (......)

(27) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයකට අදාළ නොවන්නේ,

(1) විධායකය, ව්‍යවස්ථාදායකයෙන් තේරී පත්වීම.

(2) ද්විත්ව විධායකයක් පැවතීම.

(3) ආණ්ඩුව සාමූහික මණ්ඩලයක් ලෙස ක්‍රියා කිරීම.

(4) කැබිනට් මණ්ඩලය, ව්‍යවස්ථාදායකය තුළින් තේරීපත් නොවීම.

(5) විධායකය හා ව්‍යවස්ථාදායකය අතර කිට්ටු සම්බන්ධතාවයක් පැවතීම. (......)

(28) ජනාධිපති ආණ්ඩු ක්‍රමයකට අදාළ නොවන්නේ,

(1) විධායකය බලවත් කරයි.

(2) ව්‍යවස්ථාදායකයේ බලය හීන කරයි.

(3) කාර්යක්ෂම පාලන රටාවක් ගෙන යා හැකිය.

(4) විශ්වාසභංග යෝජනාවකින් ඉවත් කළ හැකි ය.

(5) කැබිනට් මණ්ඩලයේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. (......)

(29) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,

(1) රාජ්‍ය පාලනය නිවැරදි කරයි.

(2) ප්‍රජාතන්ත්‍ර ආණ්ඩුකරණයේ මූලික පදනම වේ.

(3) ආණ්ඩුව සහ එහි කාර්යයන්ට සුජාතභාවය ලබා දෙන ලියවිල්ලකි.

(4) රාජ්‍යයක මූලික නීතිය ලෙස හඳුන්වයි.

(5) මුළුමනින් ම ලියන ලද හෝ නොලියන ලද නීතියමය ලියවිල්ලකි. (......)

(30) ව්‍යවස්ථාදායකය සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,

(1) නීති පැනවීමේ මූලික අසහනයයි.

(2) ස්ථාවර නියෝග යටතේ ක්‍රියාත්මක වේ.

(3) දේශපාලන විධාකයකේ අධීක්ෂණයට යටත්ව ක්‍රියාත්මක වේ.

(4) රාජ්‍ය මූල්‍ය පාලනය කරයි.

(5) ඒක මණ්ඩලික හෝ ද්වි මණ්ඩලික විය හැක. (......)

(31) විධායකය සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,

(1) රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කරයි.

(2) කැබිනට් මණ්ඩලයකින් යුක්ත නොවේ.

(3) ස්ථිර විධායකය මඟින් පරිපාලනය ක්‍රමවත් කරයි.

(4) සන්නද්ධ හා පොලීසීය මෙහෙයවා පාලනය කරයි.

(5) රාජ්‍ය වැඩ කටයුතු සම්බන්ධීකරණය කරයි. (......)

(32) අධිකරණය සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,

(1) යල්පැන ගිය නීති නිෂේධනය කරයි.

(2) නීති අර්ථකතනය කිරීම හරහා නව නීති සම්පාදනය කරයි.

(3) යුක්තිය පසිඳලීමේ ආයතනයකි.

(4) නීති ආධාර ආයතන පිහිටුවයි.

(5) රාජ්‍ය මූල්‍යමය ශක්තිය සවිමත් කරයි. (......)

(33) යහපාලනයේ මූලිකාංගවලට අයත් නොවන්නේ,

(1) පාරදෘශ්‍යභාවය (2) සමාජ විගණනය (3) නීතියේ ආධිපත්‍ය

(4) අධිපාලනය (5) වගකීම (......)

(34) සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මූලික ලක්ෂණයක් නොවේ,

(1) ආර්ථික කටයුතු සම්බන්ධයෙන් රාජ්‍ය වැඩි වගකීමක් දැරීම.

(2) පෞද්ගලික අංශයට ප්‍රමුඛත්වය හිමි වේ.

(3) සීමිත ආර්ථික නිදහසක් පවතී.

(4) ආර්ථික කළමණාකරණය රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශය විසින්ම කරනු ලබයි.

(5) ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන මූලධර්ම හා සමාජවාදී ආර්ථික මූලධර්ම වල එකතුවකි. (......)

(35) ජනමත විචාරණයට අදාළ නොවන්නේ,

(1) ජනතා නියෝජිතයන් තෝරාගැනීමේ ක්‍රමයකි.

(2) එය ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරයි.

(3) නීතිය පැනවීමට ජනයා කෙළින්ම සම්බන්ධ වේ.

(4) නීති පැනවීමේදී ජනයාට නිෂේධ බලය ලබාදෙයි.

(5) එය ව්‍යවස්ථාදායකයන්හි බලයට අභියෝගයකි. (......)

(36) දේශපාලන සමාජානුයෝජනය සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,

(1) පුද්ගලයා දේශපාලන සමාජයට හුරුකරයි.

(2) පුද්ගලයා දේශපාලනය ඉගෙනගන්නා ක්‍රියාදාමයක් වේ.

(3) විධිමත් හා අවිධිමත් ලෙස අධ්‍යයනය කළ හැක.

(4) දේශපාලන දූෂිත භාවයන් පුද්ගලයන් ඉගෙනගන්නා ක්‍රියාදාමය වේ.

(5) දේශපාලන පරිණතභාවය ලබා ගැනීමට උපකාරී වේ. (......)

(37) දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් අදාළ නොවන්නේ,

(1) විසිරී ඇති මහජන මතය ඒකරාශී කරයි.

(2) අනාගත දේශපාලන නායකයින් පුහුණු කරයි.

(3) ජනතාව අතර දේශපාලන ප්‍රචණ්ඩත්වය වර්ධනය කිරීම නූතන ප්‍රවණතාවයකි.

(4) දේශපාලන, ආර්ථික හා සමාජයීය ප්‍රශ්න පිළිබඳ ජනතාව දැනුවත් කරයි.

(5) දේශපාලන බලය අල්ලාගැනීමේ තරගයක යෙදෙයි. (......)

(38) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට ඇතුලත් කිරීමට උචිත නොවන්නේ,

(1) මූලික අයිතිවාසිකම් ප්‍රකාශනයයි.

(2) ආණ්ඩුවේ ත්‍රිවිධ ආයතන අතර බල බෙදීමය.

(3) පරිපාලන නිලධාරීන් බඳවාගැනීමේ කාර්යය පටිපාටියයි.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන ආකාරයයි.

(5) නියෝජන ක්‍රමවේදයයි. (......)

- **සපයා ඇති ප්‍රකාශ පදනම් කරගනිමින් අංක 39 හා 40 ට පිළිතුරු සපයන්න.**

(A) සුළු පක්ෂවලට අවාසිදායක වේ.

(B) කුඩා රාජ්‍යවලට යෝග්‍ය වේ.

(C) කුඩා පක්ෂ හා කණ්ඩායම්වලට වැඩි ඉඩකඩක් ලැබේ.

(D) අතුරු මැතිවරණ පවත්වයි.

(E) ඡන්ද දායකයා හා නියෝජිතයා අතර සම්බන්ධතාවය අඩුය.

(F) විශාල රාජ්‍යයන්වලට උචිත වේ.

(G) සෑම ඡන්දයකටම වටිනාකමක් නොලැබේ.

(H) ලැයිස්තුවකට ඡන්දය ලබාදිය යුතුය.

(I) ආණ්ඩුවේ ජනප්‍රියතාවය උරගා බැලිය හැක.

(J) නියෝජිතයන් තෝරා පත්කිරීම සංකීර්ණ ක්‍රියාදාමයකි.

(39) සරල බහුතර නියෝජන ක්‍රමයට අදාළ කාණ්ඩය වන්නේ,

(1) BCGJ (2) ADGI (3) EFGH (4) ACIJ (5) ADFH (......)

(40) සමානුපාතික නියෝජන ක්‍රමයට අදාළ කාණ්ඩය වන්නේ,

(1) CEHJ (2) BDEG (3) EFGH (4) CFHI (5) ABIJ (......)

- **ප්‍රශ්න අංක 41 සිට 50 දක්වා ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙකක් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4), (5) යන කවර හැඳින්වීම දැයි සඳහන් කරන්න.**

| අංකය | පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍යය | සත්‍යය |
| (2) | සත්‍යය | අසත්‍යය |
| (3) | අසත්‍යය | සත්‍යය |
| (4) | අසත්‍යය | අසත්‍යය |
| (5) | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තව දුරටත් විස්තර කරයි. |

| පළමුවන ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | |
|---|---|---|
| (41) 16 වන සියවස පමණ කාලයේ මධ්‍යම යුරෝපය තුළ ජාතික රාජ්‍ය ක්‍රමයේ ආරම්භය සිදු විය. | ධනවාදයේ බිඳවැටීම ඒ සඳහා බලපෑ සාධකයකි. | (......) |

| | | |
|---|---|---|
| (42) තුන්වන ලෝයේ රාජ්‍ය ලෙස හඳුන්වන්නේ නව රාජ්‍යයන්ය. | ඒවා ආර්ථික වශයෙන් අසංවිධිත වේ. | (......) |
| (43) ආණ්ඩුව ජනතාව නීතිවලට නංවාගැනීම සඳහා කිසිවිට හිංසාකාරී වාරණ ක්‍රියාත්මක නොකරයි. | එහෙත් මානසික වාරණ ආණ්ඩුව ක්‍රියාවට නංවයි. | (......) |
| (44) ආණ්ඩුව, බලය යෙදීමේ උපකරණයක් ලෙස සිවිල් සේවය භාවිතා කරයි. | ආණ්ඩුවේ ප්‍රතිපත්ති හා තීරණ ජනතාව වෙත ගෙන යන හස්තය සිවිල් සේවය වේ. | (......) |
| (45) විධායක බලය ක්‍රියාවට නංවන ආණ්ඩුක්‍රම ආකෘතියක් ලෙස ඒක පුද්ගලතන්ත්‍රය හඳුන්වා දිය හැක. | ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයක විධායක බලය සංවරණය නොවූ විට ඒක පුද්ගලතන්ත්‍ර පාලන ආකෘති ගොඩනැගේ. | (......) |
| (46) නීතිය හා සාමය ආරක්ෂා කිරීම ආණ්ඩුවක බාහිර කාර්‍යයකි. | රාජ්‍යයේ භෞතික පැවැත්ම ආරක්ෂා කිරීම ආණ්ඩුවක අභ්‍යන්තර කාර්යයකි. | (......) |
| (47) ජනතා නියෝජිතයන් තම කාර්යය නිවැරදිව ඉටු නොකරන්නේ නම් ''නැවත කැඳ වීමට'' ජනතාවට අයිතිය ඇත. | එය පුනරාවර්තනය නමින් හඳුන්වන ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රමය ලෙස නම් කරයි. | (......) |
| (48) දේශපාලන ප්‍රභූන් බිහිවීමට ධනය හා බලය වැනි සාධක බලනොපායි. | ජාතික මුද්‍රාව හා නිදහස් දිනය දේශපාලන සංකේත ලෙස භාවිත කළ නොහැක. | (......) |
| (49) 1980 දශකයෙන් පසු කාලය තුළ යහපාලනය පිළිබඳ සංකල්පය ඉස්මතු විය. | තුන්වන ලෝකයේ රටවල ආර්ථික සංවර්ධනය හා සමාජ සාධාරණත්වය ගොඩනැගීම මෙයට හේතුවිය. | (......) |
| (50) බලපෑම් කණ්ඩායම් ආණ්ඩුවට තම ආශාවන් පිළිබඳව බලපෑම් කරයි. | බලපෑම් කණ්ඩායම් කිසිවිටෙක දේශපාලන බලය ලබාගැනීමට කටයුතු නොකරයි. | (......) |

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## දේශපාලන විද්‍යාවේ මූලිකාංග - II

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

සැලකිය යුතුයි :-

- මෙම ප්‍රශ්න පත්‍රය **A** හා **B** වශයෙන් කොටස් දෙකකි.
- **A** කොටස සඳහා කෙටි පිළිතුරු සපයන්න. එක් පිළිතුරකට ලකුණු 01 කි.

---

## A කොටස

(01) ''දේශපාලන විද්‍යාව යනු රාජ්‍ය පිළිබඳ හැදෑරීමයි.'' මෙම තර්කය සනාථ කිරීම සඳහා ඉදිරිපත් වී ඇති මත 02 ක් ලියන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(02) දාර්ශනික අධ්‍යයන ක්‍රමයේ මූලිකාංග 02 ක් නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(03) දේශපාලන විද්‍යා විෂයයේ ඔබ හඳුනාගන්නා දුර්වලතා 02 ක් ලියන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(04) රාජ්‍ය සහ අනෙකුත් සංවිධාන අතර පවතින වෙනස්කම් දෙකක් දක්වන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(05) ''සමූහාණ්ඩුව'' හා ''රෝමයෙහි ඉතිහාසය'' යන ග්‍රන්ථ දෙකෙහි කතුවරු දෙදෙනා නම් කරන්න.

(1) ..............................................................................................................................

(2) ..............................................................................................................................

(06) දේශපාලන විද්‍යා විෂය අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා යුග හතරකට බෙදේ. එම යුග 04 නම් කරන්න.

(1) ..........

(2) ..........

(3) ..........

(4) ..........

(07) ග්‍රී නගර රාජ්‍ය ක්‍රමයේ සමාජයීය ලක්ෂණ දෙකක් නම් කරන්න.

(1) ..........

(2) ..........

(08) ජාතික රාජ්‍ය ක්‍රමය බිහිවීමට බලපෑ සාධක දෙකක් දක්වන්න.

(1) ..........

(2) ..........

(09) දෙවන ලෝක යුද්ධයෙන් පසුව නව රාජ්‍යයන් බිහිවීම සිදු විය. එසේ නම් එසේ බිහි වූ නව රාජ්‍යයන්හි පොදු ලක්ෂණ දෙකක් නම් කරන්න.

(1) ..........

(2) ..........

(10) සමාජ සම්මුතිවාදයට එරෙහිව ඉදිරිපත් වී ඇති විවේචන 02 ක් ලියන්න.

(1) ..........

(2) ..........

(11) විකාශනාත්මකවාදීන්ගේ සමාජ බන්ධන 02 ක් නම් කරන්න.

(1) ..........

(2) ..........

(12) ෆැසිස්ට්වාදී රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(13) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

(1) ..........

(2) ..........

(14) ආණ්ඩුවේ බලය සංවර්ධනය කිරීමට යොදාගත හැකි උපක්‍රම 02 ක් නම් කරන්න.

(1) ..........

(2) ..........

(15) සන්ධීය ආණ්ඩු ක්‍රමයක බලතල බෙදී ඇති ආකාර තුනකි. ඉන් 02 ක් පෙන්වා දෙන්න.

(1) ..........

(2) ..........

(16) ජනාධිපති ආණ්ඩුක්‍රමයක පවතින දුර්වලතා 02 ක් පෙන්වා දෙන්න.

(1) ..........

(2) ..........

(17) ව්‍යවස්ථාදායකය සංවිධානය කිරීමේ මූලධර්ම 02 කි. එම මූලධර්ම දෙක නම් කරන්න.

(1) ..........

(2) ..........

(18) දේශපාලන පක්ෂ රටින් රටට වෙනස් වුවද පොදු ලක්ෂණ කිහිපයක් හඳුනා ගත හැක. එම පොදු ලක්ෂණ 02 ක් නම් කරන්න.

(1) ..........

(2) ..........

(19) දේශපාලන හැසිරීම් කෙරෙහි බලපාන හේතු සාධක ගණනාවකි. ඉන් දෙකක් නම් කරන්න.

(1) ..........

(2) ..........

(20) නිදහස සුරක්ෂිත කර ගැනීම සඳහා නූතන රාජ්‍යයන් ගෙන ඇති විධිවිධාන දෙකක් නම් කරන්න.

(1) ..........

(2) ..........

(1 x 20 = 20)

The National e-learning Portal for the General Education

## B කොටස

(01) ''දේශපාලන විද්‍යාව යනු රාජ්‍යය හා ආණ්ඩුව පිළිබඳ හැදෑරීමයි.'' සාකච්ඡා කරන්න. (ලකුණු 20)

(02) පහත දැක්වෙන මාතෘකා පිළිබඳව සන්සන්දනාත්මකව විමර්ශණයක යෙදෙන්න.

(1) රාජ්‍ය හා ආණ්ඩුව

(2) රාජ්‍ය හා අනෙකුත් සමාජ සංවිධාන (ලකුණු 10 × 2 = 20)

(03) පහත දැක්වෙන ඒවායින් දෙකක් විස්තර කරන්න.

(1) නීතියේ ආධිපත්‍යය

(2) අයිතිවාසිකම් වර්ගීකරණය

(3) නිදහස හා සමානාත්මතාවය

(4) යහපාලනයේ මූලිකාංග (ලකුණු 10 × 2 = 20)

(04) පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ ප්‍රධාන අංග ලක්ෂණ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

(05) පහත දැක්වෙන ඒවායින් 02 ක් තෝරාගෙන විස්තර කරන්න.

(1) රාජ්‍ය යනු පන්ති ආයුධයකි.

(2) රාජ්‍ය සර්ව බලධාරී වේ.

(3) රාජ්‍ය සමාජ විකාශනයේ ප්‍රතිඵලයකි.

(4) රාජ්‍යය සම්මුතියක ප්‍රතිඵලයකි. (ලකුණු 10 × 2 = 20)

(06) පහත දැක්වෙන ඒවායින් 02 ක් පිළිබඳව විමර්ශනය කරන්න.

(1) සරල බහුතර නියෝජන ක්‍රමයේ වාසි / අවාසි.

(2) ජනමත විචාරණය

(3) සිවිල් සමාජයක ලක්ෂණ

(4) මහජන මතය (ලකුණු 5 × 4 = 20)

The National e-Learning Portal for The General Education